


# මායා ගස

සතිනි සහස්මා විජේකෝන්

# මායා ගස

## සතිනි සහස්මා විජේකෝන්

## කතෘගේ වෙනත් කෘති

දළඹු පූංචා

මහාමායා බාලිකා විදුහල,මහනුවර

5 ශ්‍රේණිය

2025-02-08

ISBN -978-624-208-887-7

# පිදුම

නිති දැනුමෙන් පෝෂණය කරන්නට වෙර දරන,

මාගේ සදාදරණීය විදුහල්පතිතුමිය,

පන්තිභාර ගුරුතුමිය ,

ඇතුළු ගුරු මව්පියවරුන්ටත්,

මා පෝෂණය කරන, ඇතිදැඩි කරන

මාගේ මව්නි,පියාණෙනි ඔබ දෙපළටත්,

මා වැනිම දැනුම හඹා යන

මාගේ සොයුරු කැළටත්

මේ පොත ආදරයෙන් පුද කරමි.

*********



# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්වදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ඔන්න එකමත් එක කාලෙක  ගමරාළ කෙනෙකුයි ගම හාමිනේ කෙනෙකුයි ජීවත් වුණා. මේ දෙන්නා හරිම දුප්පත්. එයාලා මාළු විකුණලා තමයි ජීවත් වුණේ.



ඒ වුනාට ගමරාළට එකම එක මාළුවෙක් වත් විකුණ ගන්න හම්බුනේ නෑ.

ගම හාමිනේ කිව්වා..."මේ වැඩේ හරියන්නෙ නෑ. අපි වෙන දෙයක් කරමු."

ඊට පස්සේ ගමරාල කිව්වා... "නෑ ...නෑ.. අද මම කොහොමහරි එක  මාළුවෙක් විකුණනවාමයි."

ඊට පස්සේ ගම හාමිනේ " කිව්වා හා හා ඔයා ඔය වැඩේ කරන්නකෝ.... එහෙනම් මම

තව මාළු ටිකක් අරගෙන එන්නම්" කියලා ගඟ පැත්තට ගියා. ගඟ පැත්තට යනකොට අසරණ වෙච්ච ආච්චි කෙනෙක් හම්බ වුණා.



ඒ ආච්චි කිව්වා "අනේ පුතේ, මට ගොඩක් බඩගිනි මට මොනා හරි දෙන්න පුළුවන්ද? කියලා.." ආච්චි කිව්වා.

ඊට පස්සේ ගම හාමිනේ මාළු බාන්න අරන් ආපු කෑම අච්චිට දුන්නා. ආච්චි ගම හාමිනේට ගොඩක් ස්තුති කරා . ඊට පස්සේ ඒ ආච්චී ඇහුවා "ඔයා මේ කරපු දේ වෙනුවෙන් මං ඔයාට මොනවද දෙන්න ඕනි කියලා"..

" අනේ ආච්චි මට ඔයාගෙන් මොනවත් ඕන නෑ. "කියලා ගම හාමිනේ කිව්වා. ඊට පස්සේ මේ ආච්චි ඒකට කමක් නෑ. කියලා චූටි බීජයක් මේ ගම හාමිනේට දුන්නා.



ඊට පස්සේ මේ ආච්චි කිව්වා "මේ බීජ ඔයාගේ ගෙවත්තේ පැළ කරගන්නකෝ එතකොට ඔයාගේ ගෙවත්තේ ලොකු මායා ගසක් හැදෙයි. ඔයා ඒ මායා ගසින් ඕන දෙයක් ඉල්ලන්න එතකොට ඔයාට ඒ දේ ලැබෙයි." කියලා ආච්චි කිව්වා.

ඊට පස්සේ ගම හාමිනේ මේ ආච්චිට ස්තුති කරලා මාළු බාන්න ගියා.



ගම හාමිනේ මාළු බාලා ගෙදර ආවා. එතකොට ගමරාළ ඇහුවා මොකද ඔයා මෙච්චර පරක්කු කියලා.

"මට මාළු බාන්න යද්දි අසරණ ආච්චි කෙනෙක් හම්බවුණා. ඒ ආච්චි මට මේ බීජය දුන්නා ගෙවත්තේ පැළ කරගන්න කියලා." කෝ මට බීජය පෙන්නන්නකෝ කියලා ගමරාල කිව්වා... මෙන්න බලන්නකෝ



ආ එහෙනම් අපි මේ බීජය ගෙවත්තේ පැල කරමු කියලා මේ දෙන්නා ගෙවත්තට ගිහිල්ලා මේ බීජයේ පැල කරා.



ඊට පහුවදා උදේ මේ දෙන්නා ඇහැරලා බලද්දි මේ ගෙවත්තේ ලොකු ගහක් පැලවෙලා තියෙනවා. ගම හාමිනේ පුදුම වුනා.

ඊට පස්සේ මේ දෙන්නා මේ ගහෙන් එයාලට කෑම ඉල්ලගත්තා.

ඊට පස්සේ මේ දෙන්නා ඒ ගහෙන් තමන්ට අවශ්‍ය කරන දේවල් ඉල්ලගත්තා. ඊට පස්සේ මේ දෙන්නා සතුටින් ජීවත් වුණා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විශවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ සැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

978-624-208-887-7

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්